## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත නැවත සලකාබැලීමට ශ්‍රී ලංකාව සැලසුම් කිරීම සම්බන්ධයෙන් **GNI** හි ප්‍රසාදය.

තාක්ෂණවේද අංශයේ පෞද්ගලිකත්වය සහ අදහස් ප්‍රකාශනයේ නිදහස සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ආරම්භ කළ බහු-පාර්ශ්වික සංවිධානයක් වන **ගෝලීය ජාලකරණ මූලාරම්භය (GNI)**, *2023 මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත (OSA)* සංශෝධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුව ගත් තීරණය පිළිබඳව සිය ප්‍රසාදය පළකරයි. OSA හඳුන්වාදීමේ සිට ඒ පිළිබඳව සමීප අවධානයෙන් යුතුව සිටින GNI, පෞද්ගලිකත්වය සහ අදහස් ප්‍රකාශනයේ නිදහසට ඉන් ඇති වන බලපෑම පිළිබඳව අප විසින් පෙර නිකුත් කළ ප්‍රකාශයේ දක්වා තිබූ සැලකිල්ලට ගත යුතු කරුණු පුනරුච්ඡාරණය කරයි. 2024 අගෝස්තු මස දී සංශෝධන මාලාවක් ගෙන ආවද, ජාතික සහ අන්තර්ජාතික වශයෙන් ශ්‍රී ලංකාව බැඳී සිටින මානව අයිතිවාසිකම් මූලධර්ම මූලික වශයෙන්ම උල්ලංඝනය කෙරෙන සමහර ගැටලුකාරී ප්‍රතිපාදන තවමත් පනතේ අන්තර්ගත වේ. එබැවින්, OSA ප්‍රතිශෝධනයේ දී, විශේෂඥ සහ බහු-පාර්ශ්වික ආදාන සමග, දැඩි, පාරදෘශ්‍ය සහ අයිතිවාසිකම්-පදනම් කරගත් ප්‍රවේශයක් යොදාගන්නා මෙන් අපි නව පාර්ලිමේන්තුවෙන් දැඩි සේ ඉල්ලා සිටිමු. නව ආණ්ඩුවේ පුළුල් ප්‍රතිසංස්කරණ සඳහා උපකාරී වන ආකාරයෙන්, ලෝකයේ අනෙකුත් රටවල මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ රෙගුලාසිවලින් උකහාගත්, අභිමතාර්ථයන්ට ගැලපෙන සහ මානව හිමිකම් සඳහා යෝග්‍ය භාවිතාවන් මත පදනම් වූ නවමු නීතියක් අපරානුමත කිරීම ශ්‍රී ලංකාවට උචිත හොඳම විකල්පය බවට අපි නිර්දේශ කරමු.

මේ වසර මුල දී OSA සඳහා ගෙන ආ සංශෝධන යම් තරමකට සාධනීය නවීකරණයන් වුවත්, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාවේ මෙහෙයුම් සඳහා සම්බන්ධයෙන් අතිරේක වැනි මේ වසර මුල දී OSA සඳහා ගෙන ආ සංශෝධන සාධනීය නවීකරණයන් වූ නමුත්, නීතියේ අනෙකුත් පැතිකඩවල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට බොහෝකොටම අපොහොසත් වී, හෝ තවදුරටත් නරක අතට හරවන ලදී. මීට පෙර ශ්‍රී ලංකා පුරවැසියන්ට පමණක් අදාළ වූ පනතේ විෂයපථය, පුරවැසිභාවය කුමක් වුවද, ඕනෑම පුද්ගලයෙකු සාපරාධී බවට පත්කිරීම සඳහා පහත දැක්වෙන ආකාරයට ''ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටියදී යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක්, ශ්‍රී ලංකාවේ පුරවැසියකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අවස්ථාවක දී'' යනුවෙන් කැපීපෙනෙන ලෙස ව්‍යාප්ත කර ඇත. නීතියේ දේශසීමාවන්ට බාහිර බව පිළිබඳව මෙය ඉතාම අවදානම්සහගත පූර්වාදර්ශයක් සපයන අතර, එය ක්‍රියාවේ යොදවන්නේ නම්, නීතිය පිළිබඳ අර්බුදයන්ට මඟපාදමින්, රාජ්‍යයන් අතර මිත්‍රත්වයට හා මානව අයිතිවාසිකම්වලට බරපතල ගැටලු ඇතිකරනු ඇත.

ඊට අමතරව, "අසත්‍ය" සහ "තහනම්" යන වචනවල අන්තර්ගතයන් පිළිබඳ අර්ථදැක්වීම් නොපැහැදිලි හෝ අවිනිශ්චිතව පැවතීමත්, මාර්ගගත භාෂණයේ නීත්‍යානුකූල බව පිළිබඳව තීරණය කිරීම සඳහා මහේස්ත්‍රාත්වරුන්ට පුළුල් අභිමතානුසාරී බලයක් පවරා ඇති වුවද, ඔවුන්ට පැහැදිලි මාර්ගෝපදේශ සපයා නොතිබීමත් නිසා මෙයාකාර ''වැරදි'' අර්ථදැක්වීමට සහ අත්තනෝමතික අදාළ කරගැනීම්වලට යටත් වන අතර, එමගින් භාෂණයට එරෙහිව අසමානුපාතික බාධක පැනවීමට අවස්ථාව හිමි වේ. "තහනම් ප්‍රකාශයක්" සන්නිවේදනය කළා යැයි සැලකෙන ඕනෑම තැනැත්තකුගේ අනන්‍යතාව සහ ස්ථානය පිළිබඳ

විස්තර ඉල්ලීමට ඕනෑම තැනැත්තකුට මෙම නීතිය යටතේ වැඩිදුරටත් අවසරය හිමි වන අතර, සාපරාධී වැරැද්දක් සඳහා වසර පහක් දක්වා වූ බන්ධනාගාරගත කිරීමකට පුද්ගලයන් යටත් කිරීමට ද ඉන් ප්‍රතිපාදන සැලසෙයි. මාධ්‍යවේදීන්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, සහ අන්තර්ජාතික නීතිය යටතේ ආරක්ෂිත භාෂණයේ / ප්‍රකාශනයේ අයිතිය ක්‍රියාවේ යොදවන වෙනත් අය ඉලක්ක කිරීම සඳහා වෙනත් නීතිවල පවතින මේ හා සමාන ප්‍රතිපාදන පිළිබඳව GNI විසින් අඛණ්ඩවම සිය සැලකිල්ල හා/හෝ අවධානය යොමුකර තිබේ.

නීතියේ මූලික කාර්යරාමුව තුළ පවතින නීත්‍යානුකූල බව, සමානුපාතිකත්වය, සහ අවශ්‍යතාව ආදී අන්තර්ජාතික මානව අයිතිවාසිකම් මූලධර්ම ප්‍රකාශිතවම ඇතුළත් කරගැනීම මගින්, සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ මාර්ගෝපදේශක මූලධර්ම වශයෙන් ප්‍රකාශනයේ නිදහස සහ පුද්ගලිකත්වයේ අයිතිවාසිකම ධනාත්මකව තහවුරු කිරීම මගින් ද, එවැනි උල්ලංඝනය කිරීම් සිදුවීම වළක්වාගත හැක. පාරදෘශ්‍යතාව සහ බල සමතුලනය තහවුරු කිරීම සඳහා අධිකරණ පද්ධතියේ ප්‍රමාද දෝෂ පිළිබඳ සලකාබැලීම්, බලපෑම් ඇගයීම්, සහ අභියාචනා යාන්ත්‍රණ ආදී කාර්ය පටිපාටිමය ආරක්ෂණ ක්‍රමයන් ද වැදගත් වේ. නව පාර්ලිමේන්තුවක් බලයට පැමිණ ඇති මේ අවස්ථාවේ දී, ප්‍රධාන හවුල්කාර කණ්ඩායම් සමග, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය සමග සාකච්ඡා සැසි පැවැත්වීම පිණිස ආණ්ඩුවට අවස්ථාව හිමිව තිබේ.

ලොව පුරා නොයෙක් ආකාරයේ මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ රෙගුලාසි හැඩගැස්වීමට GNI දායක වී ඇති අතර, ඒ අනුව, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සම්බන්ධයෙන් විමසා බැලීමට ශ්‍රී ලංකා ආණ්ඩුව සූදානම් වන මේ අවස්ථාවේ දී, ඒ සඳහා උපකාරී විය හැකි පුළුල් වපසරියක් තුළ විහිදුනු සම්පත් GNI සතුව ඇත. එයාකාර තීරණාත්මක නීති කෙටුම්පත් කිරීමේ දී, නිසි ක්‍රියාදාමය සහ පාරදෘශ්‍යතාව පිළිබඳ අපේ බහුපාර්ශ්වික ප්‍රවීණතාව අනන්‍ය සහ වැදගත් දෘෂ්ටිකෝණයක් සපයයි. එබැවින්, OSA සමාලෝචනය කිරීම සඳහා සම්බන්ධ වීම GNI හි අභිලාෂය වන අතර, මානව අයිතිවාසිකම් මූලධර්ම සහ හොඳම නියාමන භාවිතාවන් මත පදනම්ව සම්පාදනය කෙරෙන නව නීතියක් කෙටුම්පත් කිරීම සඳහා නව ආණ්ඩුවට සහ පාර්ලිමේන්තුවට සහයෝගය ලබාදීමට උනන්දුවෙන් සිටී.

***GNI** පිළිබඳව*

*GNI යනු, රාජ්‍ය සහ සමාගම් ප්‍රතිපත්තිවල තාක්ෂණය සහ මානව අයිතිවාසිකම් අන්තර් ඡේදනය වන කේන්ද්‍රයේ පිහිටන, වගවීම, බෙදාහදාගත් අධ්‍යයනයන් හෝ දැනුම, සහ සාමූහික උද්දේශනය සඳහා වූ ප්‍රධානතම බහු-පාර්ශ්වික සංසදය යි. පසුගිය වසර කිහිපය පුරාවට, නොයෙක් බලප්‍රදේශ හරහා විහිදෙන “මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත බව” පිළිබඳ පනත් කෙටුම්පත් සහ අතරමැදි වගකීම් පිළිබඳව සමාලෝචනය කරමින්, ඒවා පිළිබඳව අදහස් ප්‍රකාශ කරමින්, එයාකාර නීති හැඩගැස්වීම සඳහා GNI උපකාරී වී තිබේ. ප්‍රතිපත්ති සම්පාදකයන් සඳහා වන අපේ මානව අයිතිවාසිකම් විශ්ලේෂණය සහ නිර්දේශ වෙත අන්තර්ගතයන් නියාමනය සහ මානව අයිතිවාසිකම් මූලධර්ම සංක්ෂිප්තය හරහා යොමු විය හැකි අතර, අන්තර්ජාතික මානව අයිතිවාසිකම් මූලධර්ම භාවිතා කර, අයිතිවාසිකම්-ආරක්ෂා කෙරෙන ආකාරයෙන් මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත බව සහ ඩිජිටල් නියාමනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ පූර්වවිචාරී මාර්ගෝපදේශ සැපයීමත්, පුළුල් පරාසයක විහිදුනු ප්‍රතිපත්ති සම්පාදන උත්සාහයන් විශ්ලේෂණය කිරීමත් එමගින් සිදුකෙරේ.*